ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාව සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර :-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්;

*(ආ)* වත්කම් සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් කෙලවර තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරය ඉදිරිපත් කළ අය "වරප්‍රසාද මිලදී ගත් තැනැත්තායි" ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් 'ගෙවීම් සඳහා' ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද විකිණීම 2013.10.15 වැනි දින පෙ. ව. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

ටී. ගාමිණී මුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උඩ පළාත.

2013 ජූලි මස 01 වැනි දින,
ගම්පොල- උඩපළාත,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2014 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අනු. අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 | 2013.08.21 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 3,000 0 |

07-529/2

---

**හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2014

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාලව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කල බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%)ක වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක්ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක............................... දරන...................................... විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර 2013.08.07 දින පෙ.ව. 10.30 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. 2014 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන විදේශ මත්පැන් තැබෑරුම් කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2013.08.07 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන විදේශ මත්පැන් තැබෑරුම් නැවත විකිණීම 2013.10.03 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකථන අංකය : 032-2223205).

2013 ජූලි මස 01 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත.
යූ. එස්. එන්. ප්‍රනාන්දු,

ප්‍රාදේශීය ලේකම්.
හලාවත.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා දෙවන දිනය හා වේලාව* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *තැබෑරුම් වහන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|---|
| හලාවත | අංක 07 කොටස පිටිපන වීදිය, හලාවත. | 2013.08.07 පෙ.ව. 10.30 | 2013.10.03 පෙ.ව. 10.30 | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 1,500 00 |
| හලාවත | අංක 06 කොටස පිටිපන වීදිය, හලාවත. | එම | එම | එම | එම | 1,500 00 |

07-528

---

**2014 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ විදේශීය මත්පැන් රේන්දය විකිණීම**

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට පවත්වන කොන්දේසි මාලාවට යටත්ව පහත උපලේඛනයේ විස්තර දැක්වෙන විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් 2013.08.12 වැනි දින පෙ. ව. 10.30 දක්වා භාර ගනු ලැබේ.

**අංක 01. හොරණ විදේශීය මත්පැන් තැබෑරුම -**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘතිපත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුය. 2013.08.12 වැනි දින ප. ව. 3.00 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන් ද සඳහන් කර තිබිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතුය.

මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් හෝ ටෙන්ඩර්පත්‍ර භාර ගනු නොලැබේ.

04. තැබෑරුම වෙනුවෙන් එක් අයකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පවුලේ සාමාජිකයින් එක් තැබෑරුමක් සඳහා පස් දෙනකුට වඩා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැකිය.

05. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරයෙහි වම් කෙළවරේ "අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය-2014'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් සහිත කවර -

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් 2013.08.12 වැනි දින පෙ. ව. 10.30 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, හොරණ" යන ලිපිනයට එවිය යුතුය. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේ දී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය. මෙහි 3 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට උවමනා ලියකියවිලි ද රැගෙන ආ යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතුය.

07. ටෙන්ඩර්පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය හොරණ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවන හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් කර ඉදිරිපත් නොවූ හෝ ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

08. 2014 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට විදේශීය මත්පැන් තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල මොනයම් හේතුවක් නිසා හෝ 2014 වර්ෂය වෙනුවෙන් එම කාර්යය සඳහා නොලැබෙන්නේ නම්, ඒ වෙනුවට තෝරා ගන්නා ලද අළුත් ස්ථානය විවෘත කිරීමට පෙර යෝග්‍යතාවය පිළිබඳව හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු අතර, ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් එම ගොඩනැගිල්ල අනුමත කරවාගත යුතු ය.

09. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකිය.

10. මෙම දැන්වීම අනුව 2013.08.13 වැනි දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2013.10.08 වැනි දින පෙ. ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බව ද එසේම නැවත විකිණීම ද 2013.10.08 වැනි දිනයේ දී සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2013 ජුනි මස 27 වැනි දින,
හොරණ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***හොරණ අංක 01 දරන විදේශ මත්පැන් රේන්දය විකිණීම***

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *ප්‍රාදේශීය ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරන වේලාවන්* | *තැබෑරුම වසන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2013.08.10 දින දී විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01. | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 9.00 | ප. ව. 11.00 | 2013.08.13 පෙ. ව. 10.30 | 3,000 | 2013.10.08 පෙ. ව. 10.30 ට |

07-407

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වන ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැංකුව පී එල් සී නමට ලියන ලද්දාවූ ද 2008.03.10 වැනි දින සහ අංක 2349 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රණසේන චන්ද්‍රපාල විජේන්ද්‍ර යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළත්ව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2013ක් වූ අගෝස්තු මස 12 වැනි දින පෙ. ව. 11.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව කොට්ඨාසය තුළ ලියාපදිංචි) අලුත්කුරු කෝරළේ දූනගහපත්තුවේ කටාන ප්‍රාදේශීය සභාව සීමාවෙහි දෙමංහන්දිය උප කාර්යාල සීමාව තුළ කල්වරිප්පුව බටහිරහි පිහිටි දවටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. පී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 1147 9 හා 1996.11.25 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 71 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස :-

විශාලත්වය ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම නවයයි හත (අ. 0 රූ. 0 පර්. 12.97) ක් වේ.

*වැඩිදුර විස්තර සඳහා* .- 2012.06.01 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2012.06.07 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම*.- කඳවල පල්ලිය හන්දියේ සිට මීගමුව ගිරිඋල්ල පාරේ කි. මී. 1 1/2ක් පමණ ගිරිඋල්ල දෙසට ගිය පසු දකුණට හැරී මීටර් 800 පමණ ගලවල පාරේ ගමන් කළ විට පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත. දේපළට පිවිසීමට වාහන ගමක්කළ හැකි මාර්ගයක් ද ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු කළ විගස ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදල ද,
3. ගැණුම් මිලෙන් 2 1/2ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000ක් ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000ක් ද,
6. ප්‍රචාරක වියදම් ද.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී එල් සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකාර තැන (ණය අයකර ගැනීම) හැටන් නැෂනල් බැංකුව පී එල් සී අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12
දුරකථන අංක 011- 2336479 හෝ 073-151356.

06-557

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - තලංගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශිය සභා සීමාවේ, අතුරුගිරිය ඒකකය තුළ ඔරුවල පිහිටි "ගල්වරුසා ලන්ද' නමැති ඉඩමෙන් පර්චස් දහ අටක් (අ. 0 රූ. 0 පර්. 18) සහ ඊට අයත් සියලුම දේ ද වේ.

මෙම දේපළ කුමාරගේ රවින්ද්‍ර රංගජිව ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය මුදල වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් ලියා සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2005.04.25 වැනි දින අංක 2725 සහ 2006.02.24 වැනි දින සහ අංක 3000 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - අතුරුගිරිය සිට කඩුවෙල පාරේ කිලෝමීටර් 1.7ක් පමණ විද්‍යාල හන්දිය තෙක් ගොස් එතැනින් වමට ගල්වරුසා පාරට හැරෙන්න. එතැන සිට කිලෝමීටර් 3/4ක් පමණ ගොස් නැවතත් එම පාරටම දකුණට හැරෙන්න. මීටර් 300ක දුරක් ගොස් මහජන මාවතේ වමට හැරී මීටර් 50ක් පමණ ගොස් අවසානයේ න වමට හැරී අඩි 20ක් පළල ගුරු පාරේ මීටර් 50ක් පමණ ගිය තැන වම් අත පැත්තේ අදාළ දේපළ පිහිටා ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013 ක් වූ අගෝස්තු මස 14 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා.- 2009.12.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2009.12.21 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ 2009.12.16 වැනි දින තිනකරන් පුවත්පත්වල පළ වී ඇති වෙන්දේසි යෝජනාවලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින්ප හත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01%ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500ක් සහ සියලුම ප්‍රචාරක වියම් ද,
5. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු වේ. එකී 90% (සියයට අනූව) ක් වූ ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක 011- 2661821, 011- 2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාම විනිසුරු
(මුළු දිවයිනටම)

*කාර්යාලය* :
අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011- 5756356, 011- 2334808
(ෆැක්ස්) : 075 0883265.

07-603

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

### ප්‍රසිද්ධ වෙන්දේසිය

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, තලවතුගොඩ පිහිටි සිරිනන්ද ජෝතිකාරාම මාවතේ වරිපනම් අංක 40/3 දරන, ගොඩැල්ලලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. දැරණියගල විසින් මැන සාදන ලද අංක 652 සහ 1991 නොවැම්බර් මස 22 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටස, (මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 85/101 දරන වෙලුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රමාණය අක්කර 0, රූඩ් 0 පර්චස් 13.6

පර්චස් දහ තුනයි දශම හයක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේත් සමග

තව ද, බලයලත් මිනින්දෝරු ඒ. පී. දැරණියගල විසින් මැන සාදන ලද අංක 652 සහ 1991 නොවැම්බර් මස 22 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 3 මාර්ග අයිතිය ද සමග වේ. මෙය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 85/102 දරන වෙලුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1274 සහ 2010 නොවැම්බර් මස 08 වැනි දින සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. තල්වත්ත විසින් සහතික කරන ලද අංක 108 සහ 2012 ජූලි මස 18 වැනි දින දරන උකස් බැදුම්කරය මගින් මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය විමුක්ත ලියනගේ යන අය විසින් ලබා ගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැදුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම පැහැර ඇති හෙයින්,

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, 2013ක් වූ අගෝස්තු මස 08 වැනි දින ප. ව. 2.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කලල්ගොඩ හන්දියේ සිට කලල්ගොඩ පාරේ යාර 200 පමණ ගමන් කළ විට වම් පසින් සිරි නන්දජෝතිකාරාම පාර හමුවේ. එම පාරට හැරී තවත් හැතැප්ම 1/4 පමණ ගමන් කළ විට දකුණට ඇති 4 වැනි පටුමගට හැරී තවත් අඩි 200 පමණ ගමන් කළ විට අදාළ දේපළ හමුවේ. මෙම දේපළ එම පාර අවසානයේ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිර සියයට අනුව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කෙමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු, සෝෂක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න. නිති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී, අංක 46/58, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංක 011- 4218746.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්.

අංක 182, 3 වැනි මහල, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 011- 2388318.

07-591

---

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

නිව් සාරංගා හොලිඩේ ඉන්
ගිණුම් අංක : 0046 1000 1314.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 නොවැම්බර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි පන් ලක්ෂ පනස් හය දහස් දෙසිය දහ තුනයි ශත හැට නමයක (රු. 25,56,213.69) මුදල ද, 2007 සැප්තැම්බර් මස 01 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි හතර ලක්ෂ හතලිස් දහස් හාරසියයක (රු. 24,40,400) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2011.05.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2011.01.25 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.08.27 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළේ දිඹුලමුරේ ග්‍රාමයේ පිහිටි "දිඹුලමුරේ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. ඩබ්ලිව්. කේ. මනම්පේරි යන අය විසින් සාදන ලද 2003 ජනවාරි මස 06 දාතම හා අංක 1861 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් අංක 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන එච්. ඩබ්ලිව්. මුණසිංහ යන අය විසින් සාදන ලද අංක 1360 දරන පිඹුරේ නිරූපිත ඉඩම වෙන්කරන මායිම, නැගෙනහිරට : බලයලත් මානක තැන එල්. කේ. ගුණසේකර යන අය විසින් සාදන ලද අංක 2838 දරන පිඹුරේ නිරූපිත ඉඩම වෙන්කරන මායිම දකුණට : බලයලත් මානක තැන එච්. ඩබ්ලිව්. මුණසිංහ යන අය විසින් සාදන ලද අංක 2152 දරන පිඹුරේ ලොට් අංක 11 සහ ලොට් අංක 2 වශයෙන් ලකුනුකොට ඇති ඉඩම වෙන්කරන මායිම් සහ බස්නාහිරට : බලයලත් මානක තැන එල්. කේ. ගුනසේකර යන අය විසින් සාදන ලද අංක 2835 දරන පිඹුරේ නිරූපිත ඉඩම සහ එකී අංක 1861 දරන පිඹුරේ ලොට් අංක 2 වශයෙන් ලකුණු කොට ඇති අඩි 13 පළල පිවිසුම් මාර්ගය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම එකක් (අ. 0 රූ. 0 පර්. 22.1) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව එම් 25/269 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දැ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

එකී දිඹුලමුරේ ග්‍රාමයේ පිහිටි "දිඹුලමුරේ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. ඩබ්ලිව්. කේ. මනම්පේරි යන අය විසින් සාදන ලද 2003 ජනවාරි මස 06 දාතම හා අංක 1861 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් අංක 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන එච්. ඩබ්ලිව්. මුණසිංහ යන අය විසින් සාදන ලද අංක 1360 දරන පිඹුරේ නිරූපිත ඉඩම නැගෙනහිරට : ලොට් 1, දකුණට : බලයලත් මානක තැන එල්. කේ. ගුණසේකර යන අය විසින් සාදන ලද අංක 2835 දරන පිඹුරේ නිරූපිත ඉඩම වෙන්කරන මාම්ම සහ බස්නාහිරට : ඇල්ල වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතරක් (අ. 0 රූ. 0 පර්. 4.4) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව එම් 25/276 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-615/1

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. සී. ඇදිගම.
ගිණුම් අංක : 1050 5305 7601.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 සැප්තැම්බර් මස 23 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහතුන් ලක්ෂ දෙදහස් එකසිය හැත්තෑ එකයි ශත හැට හයක (රු. 13,02,171.66) මුදල ද, 2010 ජුනි 29 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑ හත් දහස් හාරසිය අසූ හතරයි ශත තුනක (රු. 11,77,484.03) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.10.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2010.10.26 වැනි දින "දිවයින" "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.08.02 වැනි දින පෙ. ව. 9.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (කෙසෙල්වත්ත - උප කාර්යාලය) වෝඩ් අංක 05හි කෙසෙල්වත්ත පිහිටි "දෙල්ගහවත්ත නොහොත් කොස්ගහලන්ද" (දෙල්ගහවත්ත නොහොත් කොස්ගහවත්ත) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. පී. එන්. එම්. ද සිල්වා යන අය විසින් සාදන ලද 1989 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 2434 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වැටකෙයියාදෙණිය, නැගෙනහිරට : ලොට් 3 දකුණට : ලොට් 66 සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි හයක් (හෙක්. 0.056) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන් , පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2434 දරන පිඹුරට අනුව වෙලුම/පත්‍රිරුව එෆ් 567/162 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2434 දරන එකී පිඹුරේ නිරූපිත සියලුම පාරවල් සඳහා වෙන්කිරීම් හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-615/2

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ජී. කෝදාගොඩ සහ ආර්. එම්. නන්දාවතී.
ගිණුම් අංක : 1046 5327 2275 .

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 පෙබරවාරි මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අට ලක්ෂ හැට හතර දහස් හාරසිය තිස් නමයයි ශත දහ අටක (රු. 8,64,439.18) මුදල ද 2010 ජනවාරි මස 13 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ තිස් තුන් දහස් නමසිය හතලිස් එකයි ශත හතලිහක (රු. 7,33,941.40) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.09 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2010.06.23 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.08.01 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කුඹල්වෙල කෝරළේ හල්පේ ග්‍රාමයේ (FVP 36) පිහිටි "පහලගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 05 දාතම හා අංක 6544 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වික්‍රමපාල කෝදාගොඩ සහ පුංචිරාලගේ උරුමක්කාරයින් විසින් හිමිකම් කියනු ලබන ඉඩම්, නැගෙනහිරට : ජී. කෝදාගොඩ සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, පාර (ප්‍රධාන මාර්ගය) දකුණට : පාර (ප්‍රධාන මාර්ගය) සහ බස්නාහිරට : පාර සහ වික්‍රමපාල කෝදාගොඩ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම අටයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 11.82) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 6544 දරන අනුව වෙලුම/පත්‍රිරුව ජේ. 71/327 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-615/3

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය

01. තිරුනාවකරසු මානික්කදේවන්
02. විජයලක්ෂමි මානික්කදේවන්

දෙදෙනාම,

අංක 83 2/3, හැම්ප්ඩන් ලේන්, කොළඹ 06

දැනට,

නඩු අංකය : 149/09/එම්. බී.

තැ. පෙ. අංක 1604,
ගැබ්රෝන්, බොට්ස්වානා

(සිය නීත්‍යානුකූල ඇටර්නි බලකාරිය වන අංක 83 2/3, හැම්ප්ඩන් ලේන්, කොළඹ 06 දරන ස්ථානයෙහි පදිංචි තනලක්කුම් සන්තිරනායගම් මගින් පෙනී සිටි)

..................................පැමිණිලිකරුවන්.

එදිරිව

ග්ලෝබස් ප්‍රොපටි ඩිවලොපර්ස්
ප්‍රයිවට් ලිමිටඩ්
අංක 18, 18 බී පී ටී ද සිල්වා මාවත,
දෙහිවල.

..................................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 13 වැනිදින දරන තීන්දු ප්‍රකාශය අනුව ;

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බ්‍රයන් නිමලසේන තාම්බු විසින් ලියා සහතික කරන ලද අංක 302 සහ 2007.02.01 දින දරන උකස් ඔප්පුවේ සඳහන් රුපියල් මිලියන හයක (රුපියල් 6,000,000) මුදල හා ඊට අදාල වර්ෂයකට 33% බැගින් පොලිය ද මෙම පැමිණිල්ලේ දින දක්වා සම්පූර්ණ මුදල ද නඩු ගාස්තු ද මෙම නඩුවේ විත්තිකරු විසින් පැමිණිලිකරුවන්ට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු කර ඇති බැවින් ද,

තවද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බ්‍රයන් නිමලසේන තාම්බු මහතා ලියා සහතික කරන ලද අංක 302 සහ 2007.02.01 දින දරන උකස් ඔප්පුව මත අයවිය යුතු හිමිකම් සහ ගාස්තු ලබා ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ සහ ඊට අයත් පරිශ්‍රයේ ඇති ගොඩනැගිලි එයට අනුබද්ධයක් සහ නීති ප්‍රකාර අයිතිවාසිකම් හිමිකම් එහි පවරවශතා අයිතිවාසිකම් සහ බල පුලුවන්කම් සමග එකී දේපළ සඳහා ඇති සියලු දේ ද තීන්දුව ප්‍රකාශය පිට ඇස්කිසි කළ හැකි බවට වැඩිදුරටත් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2010ක් වූ ජනවාරි මස 13 වැනි දින ගල්කිස්ස දිසා අධිකරණයේ නඩු තීන්දුව ඉටුකිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ අංක 18, 18 බී. පී. ටී ද සිල්වා මාවත දැන් සන්ෂයින් තුරු මාවත දෙහිවල යන ස්ථානයේ දී වර්ෂ 2013ක් වූ අගෝස්තු මස 16 වැනි දින පෙ. ව. 10.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටිකෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල පිහිටා ඇති නගර සභා කොට්ඨාස අංක 13 පී. ටී. ද සිල්වා යනුවෙන් දැන් හැඳින්වෙන සන්ෂයින්තුරු මාවත, වරිපනම් අංක 18 සහ 18 බී දරන ගොඩනැගිල්ල සහිත (දෙහිවල අංක 01 දරන වෙලුමේ 248 වන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇති ලියා පදිංචි පිඹුරේ අංක 62 වන බිම් කොටසෙහි හා 15 වන වෙළුමේ 84 වන පත්ඉරුවේ දැක්වෙන එකී අංක 01 දරන ලියාපදිංචි පිඹුරේ 61 වන ඉඩම් කොටසේ අනු බෙදීමක් වන හා බලයලත් මානක ඒ. ඩැනියෙල් විසින් වර්ෂ 1934 මැයි 14 දින දී සාදන ලද අංක 3589 දරන පිඹුරේ ඩී දරන ඉඩම් කොටස ඒකාබද්ධ කොට කරන ලද අනු බෙදීමක් වන) කල්දේරාගේවත්ත නමැති ඉඩමේ බලයලත් මානක පී. ආර්. නානායක්කාර මහතා විසින් වර්ෂ 1976 ක් වූ මාර්තු මස 06 වැනි දින දී සාදන ලද 773 දරන පිඹුරේ 62 ඩී 1 දරන බෙදා වෙන් කරන ලද මායිම්:

*උතුරට* : අංක 5812 දරන පිඹුරේ ඒ 2 දරන බිම් කොටස ද,
*නැගෙනහිරට* : අංක 62 ඩී 2 දරන බිම් කොටස ද,
*දකුණට* : අංක 62 ඩී 3 දරන බිම් කොටස ද,
*බස්නාහිරට* : සන්ෂයින් තුරු මාවත මායිම් වන්නාවූ ද,

එකී මානක විසින් සාදන ලද අංක 773 දරන පිඹුර අනුව හා ප්‍රමාණයෙන් පර්චස් දහයකුත් දශම හයයි දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 10.625 විශාල වේ).

(මෙය ගල්කිස්ස ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ අංක 02 වෙලුමෙහි පත්ඉරු 60/37-38 යටතේ ලියාපදිංචි කර ඇත)

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
02. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 8,000,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. ගමන් ගාස්තු (බිල්පත් ඉදිරිපත් කරමි)
05. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු විකුණුම් මිලෙන් 2.5%,
06. රජයේ ගාස්තු හෝ පළාත් සභා ගාස්තු,
07. ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500,
08. ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත දී ගල්කිස්ස දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ගාමිණී සේනානායක,
නීතිඥ සහ නොතාරිස්,
අංක 08,
විල්සන් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 077-5163351.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් 011- 2445393
දුරකථන 011- 2396520
ඊමේල් : senaservice@sltnet.lk

07-601

### මහජන බැංකුව - බේරුවල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**විශාල වටිනාකමකින් යුත් නිශ්චල හා චංචල දේපළක්**

*නිශ්චල දේපළ :*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණේ, බේරුවල බද්දේ බේරුවල නගර සභා සීමාවේ, "නල්ලහේන" හි පිහිටා ඇති "තොටබොඩයාවත්ත" නමැති ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0 රූ. 0 පර්. 15) විශාල ඉඩම සහ එය තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු සියලු දෙය ද වේ.

*චංචල දේපළ :*

පහත විස්තර කර ඇති පරිශ්‍රයන්හි පවත්වාගෙන යනු ලබන කාලයෙන් කාලයට මිලදී ගෙන "මොෂා", ගාළු පාර, හෙට්ටිමුල්ල, බේරුවල යන ස්ථානයේ තබා ඇති සියළුම යන්ත්‍ර සූත්‍ර සමග උපාංග අමතර කොටස් සහ ආදේශකයන් හෝ වෙනත් පරිශ්‍රයන්හි ඇති එවැනි යන්ත්‍ර සූත්‍ර එම පරිශ්‍රයන්හි ගෙන්වා ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳ පහත විස්තර කෙරේ.

1. මාදිලිය : කිර්ලොස්කාර් කේ. සී 63
   අනුක්‍රමික අංකය : 346 කේ 024
   ප්‍රමාණය : ටොන් 30
   මිල : ඇමරිකානු ඩොලර් 25000

2. මාදිලිය : මයිකොම් එන් 6ඒ
   අනුක්‍රමික අංකය : 20203
   ප්‍රමාණය : ටොන් 10
   මසෙකාවා සමාගම : ජපානය
   මිල එෆ්ඕබී : 11.818

3. සම්පීඩක සඳහා විදුලි මෝටරය :
   අවාන සම්පූර්ණයෙන්ම වසන ලද වර්ගය
   කේ. ඩබ්. 97
   මාදිලිය : සීමන්ස් එල්. ඒ.
   අනුක්‍රමික අංකය : එන් 8/142755

4. අතික්ෂාර (ලුණු සහිත) සීත දඟරය :
   වර්ගය : රේසර් වර්ගයේ දඟරය
   දඟර ද්‍රව්‍ය : වාට්මූට්ටු රහිත වානේ නලය
   40 උපලේඛනය : ඉපොක්සි ආලේපිත

5. අයිස් නිපදවන ටැංකිය :
   ටොන් 30 අයිස් නිපදවීම
   කි. ග්‍රෑම් 50/කෑන්x15 කෑන්/කැන්ග්‍රිඩ්x40 කැන්ග්‍රිඩ් - කෑන් 600

6. අයිස් කෑනය
   ප්‍රමාණය : අයිස් කුට්ටි කි. ග්‍රෑම් 50
   පරිමාණය : මි. සී. 395 (මි. මී. 160) ඩීxමි. මී. 1100 එච් (මි. මී. 340) වොට්xමි. මී. 205
   ඝණකම : මි. මී. 2

7. චූෂණ රථය :
   වර්ගය : දියර පාදය සහිත සිරස් සිංගාරම
   ද්‍රව්‍යය : ඇමෝනියා දියර මට්ටම් පාලකය
   කපාට හා ස්විචය

8. හිම දියවීමේ වතුර ටැංකිය :
   වර්ගය : එක්වරකට කැබලි 15ක ප්‍රතිඵලය සඳහා
   ද්‍රව්‍යය : ගැල්වනයිස් කළ මෘදු වානේ

9. පිරවුම් වතුර ටැංකිය :
   ප්‍රමාණය : වතුර සමග කෑන් 15
   ද්‍රව්‍යය : ගැල්වනයිස්

10. මස්තිෂ්ක කළඹකය :
    වී බඳ පටිය එලවෙන මෝටරය
    මෝටරය : කි. වො. 7.5 වො 400 හර් 50 ආර් පී එම් 1450

11. අයිස් කුඩුකරන යන්ත්‍රය :
    වර්ගය : යාන්ත්‍රික කුඩුකරණ යන්ත්‍රය
    ප්‍රමාණය : ටොන්/එච් ආර් 10
    මෝටරය : කි. වො. 10 වොට් 400
    ද්‍රව්‍යය : මල නොබඳින ආලේපය සමග මෘදු වානේ

12. හරස් සහ දිගට ගමන් කරන එසවුම් දොඹකරය :
    ප්‍රමාණය : ටොන් 2

13. සීත කාමරය :
    කෘතිමව ස්ථාපනය කරන පනේලය
    ස්ථාපිත ද්‍රව්‍යය : පොලියුරතින්
    බිත්ති ඝණකම : මි. මී. 100
    සිවිලිම ඝණකම : මි. මී. 100
    ශීත කාරක ඒකක මාදිලිය බිඩ්සර් - ජර්මනි

14. විද්‍යුත් පද්ධතිය :
    ප්‍රධාන විද්‍යුත් පනේල් ඵලකය ඇතුලත්ව
    ප්‍රධාන විද්‍යුත් පනේල් ඵලකය : ලං. වි. ම. ට්‍රාන්ස්ෆෝමරය

15. ධාරිත්‍රකය ශීතකරන කුලුන :
    සහ ශීත කරන නලය, ගෑස් ග්‍රාහක ටැංකිය

16. වතුර පද්ධතිය
    නල ළිඳක් ඇතුළුව, වැඩි ප්‍රමාණයක් ඇති ටැංකිය
17. ඇමෝනියා වායුව ආරෝපනය කර විලි දැනීම
    අළුත්වැඩියා කිරීම හා පැවරීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013ක් වූ අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා වර්ෂ 2013.06.07 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, වර්ෂ 2013.05.09 වැනි දින දිනමිණ ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* ගාල්ල සිට කොළඹ දෙසට එන විට බේරුවල බෝගස මංසන්ධියෙන් මදක් මෙපිටින් වම් පසට ඇති මංගල පාරේ (රෝහල පාර) මීටර් 400ක් පමණ ගිය විට පාරේ දකුණු පස යෝජිත දේපළ හමුවේ. ප්‍රවේශ බාධක නොමැත. වාහනයකින් දේපළ වෙත ළඟා විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කළුතර) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර) අංක 341, ගාලු පාර, පානදුර වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක 038- 2235401, 038- 2232438, ෆැක්ස් අංකය : 038- 2234727.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා ඉහත ලිපිනයෙන් විමසන්න. ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම)

*කාර්යාලය* : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011-5756356, 011- 2334808 (ෆැක්ස්)
*නිවස* : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථන අංක : 011- 2419126, 075 0883265.

07-604

---

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - තල්ගස්වල ශාඛාව

(කලින් රුහුණ සංවර්ධන බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2013.08.08 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ. ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබඩපත්තුව (උතුර) ගෝනලගොඩ පිහිටි ඉන්ගලහේන නමැති ඉඩම බෙදා වෙන් කළ අංක 02 දරන රූඩ් දෙකයි, පර්චස් පහයි දශම පහක් (අ. 0, රූ. 02, පර්. 05.5)ක් විශාල ඉඩමේ බිම සහ එහි තුළ පිහිටි සියලු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

02. ඉහත කී ගෝනලගොඩ පිහිටි, ඉන්ගලහේන නමැති ඉඩම බෙදා වෙන් කළ අංක 03 දරන රූඩ් එකයි, පර්චස් තිහයි දශම පහක් (අ. 0, රූ. 01, පර්. 30.5) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2010.01.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද*, 2010.11.10 දින දිනමිණ, තිනකරන් හා ඩේලි නිවුස් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - තල්ගස්වල මාපලගම පාරේ කි. මී. 1.5ක් පමණ ගිය විට ගෝනලගොඩ දක්වා ඇති පාර හමුවේ. එම පාරේ කි. මී. 02ක් පමණ ගොස් දකුණුපසට වැටී ඇති පාරේ කි. මී. 01ක් යන විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැනුම්කරු විසින් මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ, දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041 - 2231532, 2226208, 2226209, 091- 2296491.

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරඳුවත්ත, වල්ගම, මාතර.
දුරකථන අංකය : 041- 2228731, 071-4438516.

07-423

---

## මහජන බැංකුව - පිළියන්දල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

### වරිනා ව්‍යාපාරික සමාගමක්

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ මඩපාත යන ගම පිහිටි "කහටගහවත්ත" නමැති බලයලත් මානක එස්. වික්‍රමගේ මහතා විසින් 2003.09.20 වැනි දින මැන සාදන ලද අංක 9128 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් එකයි පර්චස් තිස් එකයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 31.5) ක් විශාල

ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

ඉහත සඳහන් ඉඩම 1948.06.07 වැනි දින මිනින්දෝරු ඩබ්. ඒ. ඇල්. ද සිල්වා මහතා මැන සාදන ලද අංක 1242 දරන පිඹුර ප්‍රකාර (අ. 3, රූ. 3, පර්. 2) විශාල ඉඩමෙන් නොබෙදූ හතෙන් පංගුවක බිම් කොටසට බලයලත් මිනින්දෝරු ඇන්. ද ඇන්. වීරක්කොඩි මහතා විසින් 1994.10.13 වැනි දින මැන සාදන ලද අංක 4094 දරන පිඹුර ප්‍රකාරව (අ. 0, රූ. 1 , පර්. 35) විශාලව නැවත කළ මැනීමක් වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013ක් වූ අගෝස්තු මස 15 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2009.08.21 දිනැති *රජයේ ගැසට් පත්‍රය* 2009.11.18 දිනැති දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීම්වලට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - පිළියන්දල නගරයෙන් හොරණ පාරේ පුවක්ගස් හන්දියෙන් දකුණට ඇති මඩපාත පාරේ කි. මී. 3ක් පමණ ගිය විට හමුවන බටකැත්තර හන්දියෙන් දකුණට දාම්පේ පාරේ මී. 500ක් පමණ යාමේ දී වම්පසට සෙන්මිචෙල් නිවාඩු නිකේතනය දෙසට යන දාම්පේ පාර හමුවේ. මෙම පාරේ කි. මී. 01ක් පමණ යාමේ දී වම්පසට හමුවන ගංගාරාම විහාර පාරේ මී. 50ක් පමණ ඉදිරියට යන විට එම පාරට මායිම්ව වම්පස අංක 92 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්.
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හයිලෙවල් පාර, නුගේගොඩ, අංක 177 ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ පිටත) ගෙවිය යුතු ය.

දුරකථන අංක : 825102, 825101, 817737.

ඉහත සඳහන් ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ එම දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස්,
හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 071-8021206.

07-551

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සමන්ත ජයවික්‍රම ඇන්ඩ් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0010 1000 8383

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 අගෝස්තු මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන්කෝටි පනස් එක් ලක්ෂ හතලිස් හය දහස් නමසිය පනස් නමයයි ශත හැත්තෑ හතරක (රු. 55,146,959.74) මුදල ද 2008 අප්‍රේල් මස 02 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි දෙලක්ෂ පනස් පන් දහස් හැත්තෑ පහක ( රු. 40,255,075) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් එක් කෝටි විසි තුන් ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය පනහක (රු. 1,23,43,750) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.06.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ,* 2009.02.03 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.08.08 වැනි දින පෙ. ව. 11.00 ට සහ මධ්‍යහ්න 12.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර ග්‍රැවට් 4 සහ නගර සභා සීමාවන් තුළ වල්ගම පිහිටි අනගාරික ධර්මපාල මාවත, වරිපනම් අංක 14 (1) දරන "අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් ඒ හි ලොට් 4 යයි කියනු ලබන (බලයලත් මානක තැන එච්. ජේ. සමරපාල යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු මස 20 දාතම හා අංක 899 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 ඒ සහ 4 බී හි ඒකාබද්ධකිරීමක් හා නැවත මිනුමක් වන) ඉඩමට බලයලත් මානක තැන පී. එම්. අබේගුණවර්ධන යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් 26 දාතම හා අංක 346 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර, නැගෙනහිරට : පිඹුරු අංක 899 හි ලොට් බී (නිවාස වලට පාර) දකුණට : පිඹුරු අංක 899 හි ලොට් සී සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1 2 සහ 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නමයයි පහක් (අ. 0 රූ. 0 පර්. 10.95) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන් ම පස, ගහකොළ වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 346 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති පරිදි සම්පූර්ණයෙන් ම ලොට් 4 ඒ සහ 4 බී හි ඒකාබද්ධ කිරීමේ නැවත මිනුමකි.

එකි වල්ගම පිහිටි "අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් ඒ හි ලොට් 4 යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ජේ. සමරපාල යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු මස 20 දාතම හා අංක 899 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට

ලොට් 4 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරටඃ ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් බී (අඩි 15 පළල පාර) දකුණට : අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් සී සහ බස්නාහිරට : අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් 4 බී සහ ලොට් ඒ හි ලොට් 2 සහ 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හයයි තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.630) විශාලඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 899 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ඒ 499/199 යටතේ එම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වල්ගම පිහිටි "අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් ඒ හි ලොට් 4" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ජේ. සමරපාල යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු 20 දාතම හා අංක 899 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්නය කොට ලොට් 4 බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 2 නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4 ඒ දකුණට : අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් සී සහ බස්නාහිරට : අත්තලයිවත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් ඒ හි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකක් (අක්. 0, රූඩ් 0, පර්. 1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 899 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 499/200 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1205 දරන උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ග්‍රැවට් 4 සහ නගර සභා සීමාවන් තුළ හිත්තටිය පිහිටි මීරා පාර, වරිපනම් අංක 83 දරන " කහම්පලේ කුරුඳුවත්ත නොහොත් ඊසදීන් නගරය" යයි කියනු ලබන (බලයලත් මානක තැන බී. අත්තනායක යන අය විසින් සාදන ලද 1987 මාර්තු මස 22 දාතම හා අංක 1000 දරන පිඹුරේ නිරූපිත ලොට් 20 හි නැවත මිනුමක් වන) ඉඩමට බලයලත් මානක තැන පී. එම්. අබේගුණවර්ධන යන අය විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 04 දාතම හා අංක 280 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති සහ (වරිපනම් අංක 79 දරන) ඉඩම් කොටසට මායිම්, උතුරට : මීරා පාර නැගෙනහිරට : පිඹුරු අංක 1230 හි ලොට් 18 (වරිපනම් අංක 79 දරන) දකුණට : පාර සඳහා වෙන්කිරීම (අඩි 10 පළල පාර) සහ බස්නාහිරට : පිඹුරු අංක 1230 හි ලොට් 22 (වරිපනම් අංක 87 දරන) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (අක්. 0 රූඩ් 1 පර්. 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 280 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 467/50 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1153 දරන උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-614

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.